## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ගෙවිය යුතු රු.1,135,312 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.1,135,312 ක් වූ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ සටහන් යටතේ අනාවරණය කර තිබුණි. | උපචිත වියදම් ලෙස හඳුනාගත හැකි සියලුම වියදම් ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මිලදී ගන්නා ලද රු.830,989 ක් වූ පරිගණක උපකරණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.212,747 ක් ක්ෂය කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගණනය කිරීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |
| (ඇ) පසුගිය වර්ෂයේ පරිගණක ක්ෂය රු.290,919 ක් අඩුවෙන් දැක්වීම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉකුත් වර්ෂයේ සිදුකරන ලද විගණන නිර්දේශ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළයුතු වීම. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. (මිලියන) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ක්ෂය වටිනාකම | 2.0 | වත්කම් මිලදී ගත් දින හා ඒවායේ පිරිවැය සහිත උප ලේඛන | බොහෝ ස්ථාවර වත්කම් දීර්ඝ කාලයකට පෙර මිලට ගෙන ඇති අතර මිලදී ගත් තොරතුරු සොයා ගැනීමට අපහසු වී ඇත. මෙම | ක්ෂය වටිනාකමෙහි නිවැරදිතාවය තහවුරු කරගැනීමට අදාළ ලේඛන |

| | | | |
|---|---|---|---|
| | | වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමටත්, මෑත කාලයේ මිලදී ගත් සියලුම ස්ථාවර වත්කම්වල වටිනාකම් එම ලේඛනයේ ඇතුළත් කිරීමටත් කටයුතු කරමි. | විගණනයට ඉදිරිපත් කළ යුතු වීම . |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (සංශෝධන) පනත | | | |
| (i) 10 (අ) වගන්තිය | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පුද්ගලයින් පස්දෙනෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතු වුවත් එවැනි උපදේශක සභාවක් පත්කර නොතිබුණි. | "ජාත්‍යන්තර උපදේශක සභාව" පත් කිරීම ප්‍රතිපත්තිමය කරුණක් බැවින් නිසි ලෙස අධ්‍යයනයකින් පසුව ඒ සම්බන්ධයෙන් ඉදිරි කළමනාකරණ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡාවට ගැනීමට කටයුතු කරන බව දන්වමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතු වීම . |
| (ii) 10 ඉ (1) වගන්තිය හා 10 ඉ (2) වගන්තිය | පනත ක්‍රියාත්මක වන දිනයේ සිට එනම් 2006 සැප්තැම්බර් 29 දින සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය, මෙම ආයතනය වෙත පවරා ගත යුතු අතර එය ආයතනයේ ඒකකයක් වශයෙන් පුහුණු වැඩසටහන් හා වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්විය යුතුය. තවද එහි සේවයේ නියුක්තව සිටි නිලධරයන් හා සේවකයින්ද, ආයතනයේ නිලධරයන් හා සේවකයින් ලෙස සැලකිය යුතුය. එසේ වුවත් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | විදේශ කටයුතු ලේකම්ගේ උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීම උචිත බව බණ්ඩාරනායක ජාත්‍යන්තර පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක : BIDTI/Admin/Aud/22 හා 2022 නොවැම්බර් 24 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) 10 ඉ (2) (i) වගන්තිය | පනත ක්‍රියාත්මක වන දිනයට පෙර බණ්ඩාරනායක | - එම - | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් පවත්වාගෙන යන යම් ගිණුමක බැරට තිබූ සියලු මුදල් ආයතනයේ අරමුදලට මාරු කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | | |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.6.5.3 වගන්තිය | යම් වර්ෂයකට අදාළ වාර්ෂික වාර්තා ඊළඟ වර්ෂයේ මැයි 31 දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් ආයතනය 2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි. | ආයතනය මඟින් පිළියෙළ කර තිබුණු 2016, 2017 හා 2018 යන වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත භාර දී ඇත. 2019, 2020 හා 2021 වාර්ෂික වාර්තා නොපමාව විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම . |
| (ඇ) | 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.1 ඡේදය | විධායක අධ්‍යක්ෂකවරයාට චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගෙවිය යුතු මාසික දීමනාව රු.60,000 ක් වුවද, 2015 අගෝස්තු සිට 2022 අප්‍රේල් මාසය දක්වා සේවය කළ විධායක අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුට මසකට රු.150,000 ක සිට රු.180,000ක පරාසයකින් මාස 71 ක් සඳහා රු.11,761,000 ක් ගෙවා තිබුණි. ඔවුන් වෙත ගෙවිය යුතු දීමනාව රු.4,260,000 ක් වූයෙන් රු.7,501,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | විධායක අධ්‍යක්ෂකවරුන් වෙත දීමනා ගෙවීම සම්බන්ධයෙන් ඇති ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම . |
| (ඈ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 3.2.1 වගන්තිය | ආයතනයට පැවතිය යුතු තනතුරු ප්‍රමාණය, බඳවා ගැනීමේ පටිපාටි, වැටුප් ව්‍යුහය හා දීමනා සඳහා | 2018 ඔක්තෝම්බර් 16 දිනැති ලිපිය මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශයේ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම . |

| | | | | |
|---|---|---|---|---|
| | | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කාර්ය මණ්ඩල විස්තර ඉදිරිපත් කර ඇත. | |
| | (ii) 6.6 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස දහයක් ප්‍රමාද වී 2022 නොවැම්බර් 24 දින ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂයට අදාළව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇති අතර එම වාර්තාව 2022 නොවැම්බර් 09 වන දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමත කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම . |
| (ඉ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (01) ඡේදය | සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ පනත් මගින් ආයතනයේ සේවක මණ්ඩලය වෙත වැටුප් නියම කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද, වැටුප් හා සේවක සංඛ්‍යා කමිටු නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය රහිතව විෂය භාර අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි ප්‍රතිපාදන අනුමත කිරීමෙන් වැළකී සිටිය යුතුය. එසේ වුවද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විදේශ අමාත්‍යාංශයෙන් ආයතනය වෙත අනුයුක්ත කළ නිලධාරීන් පස්දෙනෙකු සඳහා රු.836,344 ක් ද ආයතනයේ වැඩ බලන ගණකාධිකාරීකාරීවරයෙකු වෙත රු.180,000 ක් ද සමාලෝචිත වර්ෂයේදී දීමනා වශයෙන් ගෙවා තිබුණි. | මෙම ආයතනය ආරම්භයේ සිටම විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් අනුයුක්ත කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත දීමනා ගෙවීම් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම . |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 හා 2016 ඔක්තෝම්බර් 21 දිනැති අංක 02/2016(i) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ | ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම සඳහා සේවා කාණ්ඩ 04 ක් යටතේ හා මධ්‍යම කළමනාකරණ මට්ටම සඳහා සේවා කාණ්ඩ 03 ක් යටතේ ඒ ඒ තනතුරු පිහිටුවිය යුතු අවම හා උපරිම වැටුප් කේත 04 ක් දක්වා තිබුණ ද ඒ යටතේ හඳුනා නොගෙන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (පුහුණු) හා අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) වෙත පිළිවෙළින් රු.2,160,000 ක් හා රු.1,717,742 ක් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ගෙවා තිබුණි. | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත දීමනා ගෙවීම් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,075,825 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,397,748 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,473,573 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් ආදායම් රු.18,646,788 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 පෙබරවාරි 23 දිනැති අංක අමප 003/214/0202/06 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ (අ) වගන්තිය පරිදි කොළඹ 07, හෝර්ටන් පෙදෙස , අංක 24 ස්ථානයේ තිබෙන දේපලවල හිමිකාරීත්වය ආයතනය වෙත පවරා ගෙන නොතිබුණි. | ආයතනය පිහිටා ඇති කොළඹ 7, හෝර්ටන් පෙදෙස, අංක: 24 දරන ස්ථානයේ තිබෙන දේපළ පවරා ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින බව ප්‍රාදේශීය ලේකම් විසින් 2021 අප්‍රේල් 28 දිනැති ලිපිය මඟින් විදේශ කටයුතු ලේකම් වෙත දන්වා ඇත. | දේපලවල හිමිකාරීත්වය ආයතනය වෙත පවරා ගැනීම කළ යුතු වීම. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, පුස්තකාලයාධිපති සහ සන්නිවේදන කළමණාකරු යන තනතුරු සඳහා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරින් නැවත සේවයේ පිහිටුවා තිබුණ ද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව 2016 පුවත්පත් දැන්වීමක් පළකිරීම මඟින් පුරප්පාඩුව පැවති අනුමත පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවාගෙන දීමනා ගෙවීම් කර ඇත. | විධිමත් අනුමැතිය සහිතව බඳවාගැනීම් කළ යුතු වීම. |